# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No. RG/MBD/1/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය
த. பெ. இல.
P. O. Box No. 565

ඔබේ අංකය
உமது இல.
Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය
திகதி
Date 2022.12. 23


චක්‍රලේඛ අංකය - 16/2022

සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්/ ප්‍රාදේශීය ලේකම්වරුන් මගින්

සියළුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්.

**<u>මරණ පරීක්ෂක තැනගේ සහතිකය ( ලියාපදිංචි කිරීම - බී18) සංශෝධනය කිරීම.</u>**

මරණ සම්බන්ධයෙන් ජීව සංඛ්‍යාති වාර්තා නිසි පරිදි සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු නිවැරදිව වාර්තා විය යුතු අතර ඒ සඳහා මරණයට හේතුව නිසි පරිදි ලබා ගැනීමට දැනට භාවිත වන මරණ පරීක්ෂක තැනගේ සහතිකය (බී 18)මගින් ලබා ගන්නා තොරතුරු ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ.

02. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමග අප දෙපාර්තමේන්තුව එක්ව මරණ පරීක්ෂක තැනගේ සහතිකය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්ණායකයන්ට අනුකූල වූ නව ආකෘතියක් මේ වන විට සකසා ඇති අතර, එහි පිටපතක් ඔබගේ දැන ගැනීම සඳහා මේ සමග අමුණා එවමි.

03. නව සංශෝධිත බී 18 ආකෘතිය පිටපත් දෙකකින් පොතක් ලෙස සකස් කර ඇති අතර එක් පොතක් පිටු 50 කින් සමන්විත වේ. මෙම නව බී 18 ලේඛණ භාවිතය 2023.01.01 දින සිට ක්‍රියාත්මක වේ. මෙම පොත් ප්‍රමාණවත් තොග ඔබ භාරයේ ගබඩාකර තබා ගෙන නිකුත් කිරීමට කටයුතු කරන ලෙසත් ලේඛණය අවසන් වූ පසු දෙවන පිටපත් ( කාබන් පිටපත සහිත ලේඛණ) ඔබ භාරයට ගෙන ලියාපදිංචි නොවූ මරණ ලියාපදිංචිය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙසත් වැඩිදුරටත් දන්වමි.

04. මෙම ලේඛනයේ සටහන යොදන ආකාරය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මේ වන විටත් මරණ පරීක්ෂකවරුන් දැනුවත් කර ඇති අතර රටෙහි පවතින කඩදාසි හිඟය මත මෙම අවස්ථාවේ දී මුද්‍රණය කර ඇති ලේඛණයේ පිටපත ලිවීමේ දී කාබන් කඩදාසියක් භාවිත කළ යුතු බවට ඔබ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සේවය කරන සියළුම මරණ පරීක්ෂකවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

05. මෙම වැඩපිළිවෙල නිසි පරිදි ක්‍රියාත්මක කරවීම සඳහා ඔබගේ සහාය ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්.


දූරකථන : 011-2889540
ෆැක්ස් : 011-2889498
විද්‍යුත් ලිපිනය : mbd@rgd.gov.lk





දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No.: 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No.: 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: rgd@sltnet.lk, rg@rgd.gov.lk